# 11 දළදා පෙරහැර

අසිරිමත් දළදා පෙරහැර නැරඹීමට ජනතාව මහත් උනන්දුවෙන් බලා සිටිති. ඒ අතර ශ්‍රී ලාංකිකයන් පමණක් නොව විදේශිකයෝ ද සිටිති. සෑම ජාතියකට ම, ආගමකට ම අයත් වුවෝ ද එහි වෙති.

රාත්‍රි අහස්කුස දෙදරවමින් මහ වෙඩි හඬක් නිකුත් වෙයි. ඒ පෙරහැරේ ආරම්භක සංඥාවයි. සියල්ලෝ ම නොඉවසිලිමත් ව පෙරමග බලති. මේ රන්දෝලි පෙරහැර වීථි සංචාරය කරන අවස්ථාවයි.

පෙරහැර ඉදිරියෙන් ම ගමන් කරන්නෝ කස කාරයෝ ය. ඔවුහු හිසට ජටාවක් බැඟින් බැඳ සිටිති. දිගු කස තම හිස් වටා කරකවමින් මහ හඬින් කස පුපුරවති. ඒ හඬින් පෙරහැරට ගමන් කිරීමට ඉඩකඩ ලබා දෙමින් මිනිස්සු තව තවත් දෙපසට වෙති.



දෑත්වල වේගයෙන් පන්දම් කරකවමින් ගිනි පන්දම්කරුවෝ පැමිණෙති. ඔවුන්ගේ හිස වටා කැරකෙන පන්දම් ගිනිවළලු මෙන් ඈතට පෙනෙයි. තවත් වරෙක ඒවා ඉහළ පහළ නගින බසින ගිනිබෝල ලෙස දුරට දිස්වේ. කුඩා ළමයි විස්මිත දෑසින් එදෙස බලා සිටිති.

මේ දර්ශනවලින් පසු පෙරහැර සන්සුන් බවක් උසුලයි. මීළඟට බෞද්ධ කොඩි රැගත් කණ්ඩායමක් පැමිණෙති. ඔවුහු සුදෝ සුදු ජාතික ඇඳුමෙන් සැරසී සිටිති. ඔවුන්ගේ ගමන සන්සුන් ය. මෙය දකින නරඹන්නන්ගේ සිත් ද සන්සුන් වෙයි.



පෙරමුණේරාල රැගත් ඇතා පෙරහැරේ මුලින් ම ගමන් කරයි. ඉන්පසුව ගජනායක නිලමේ ඇතා පිට පැමිණෙයි. මේ සියලු ම ඇත්තු විසිතුරු ඇඳුමෙන් සැරසී සිටිති. මේ අතර නැටුම් කණ්ඩායම් සිත් ඇදගන්නා වූ රැඟුම් දක්වති. උඩරට පහතරට නැටුම්වලින් දළඳා පෙරහැර අලංකාර වෙයි.



දන්ත ධාතූන් වහන්සේ සහිත කරඬුව රැගත් ඇත් රජු පරිවාර ඇතුන් සමග ගාම්භීර ලීලාවෙන් පෙර හැරේ ගමන් කරයි. දළඳ කරඬුව තමා පිට ඇති බවක් දත් නිසාදෝ මාලිගාවේ ඇතා සෙසු ඇතුන්ට වඩා සැදූහැවත් බවක් හා අභිමානවත් බවක් පෙන් වමින් ගමන් කරයි. පාවාඩ එළන්නෝ ඉතා කඩිසර ව මෙම ඇතාට පාවාඩ එළති. පෙරමග පාවාඩ එළීම ප්‍රමාද වුවහොත් ඇතා මඳක් නවතියි. පාවාඩ එලූ පසු ඒ මතින් යළි සිය ගමන ශාන්ත ව අරඹයි.



දියවඩන නිලමේතුමා පැමිණෙන් නේ ඉන් පසුව ය. එතුමා සාම්ප්‍රදායික විසිතුරු ඇඳුමෙන් සැරසී, සාඩම්බර ලීලාවෙන් ගමන් කරයි. එතුමාගේ ආරක්ෂාව සඳහා මාලිගාවේ විදානේවරු ගමන් කරති.

මේ මහා පෙරහැර ආරම්භයේ සිට අවසානය දක්වා ම විවිධ විචිත්‍ර අංගයන්ගෙන් අලංකාර වෙයි. දළදා කරඬුව රැගත් ඇතාට පසුපසින් කවිකාර මඩුල්ල ගමන් කරති. අසිපත් අත දරාගත් කුඩා ළමයි කණ්ඩායම ද ඒ පසු පසින් ගමන් කරති. ඒ සමග ම මල් පහන් රැගත් කුඩා ළමයි ද ගමන් කරති.

දළදා පෙරහැරට සිවු දේවාල පෙරහැර ද එකතු වේ. නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන දේවාලවල පෙරහැර ඊට අයත් ය. ඉදිරියට ඇදෙන පෙරහැරෙහි තැනෙක පන්තේරු නැටුම් ය. ඊට පිටුපසින් ලී කෙළි නැටුම් ය.



කතරගම දේවාල පෙරහැර ඉදිරිපත් කරන "කාවඩි" කාගේත් සිත් ගත් නැටුමකි. පෙරහැර නරඹන සමහර අය ද කාවඩි තාලයට පාද තබමින් නටති. මේ අලංකාර කාවඩි නැටුමෙන් පසු පෙරහැරේ නැටුම් ගැයුම් අවසාන වේ.

දළදා පෙරහැර නිමාවට පත්වන්නේ දිය කැපීමේ උත්සවයෙනි. පේරාදෙණිය අසල ගැටඹේ මහවැලි ගංතොටේ දී මෙය සිදු වේ. දිය කැපීමේ උත්සවය හිමිදිරියේ ම පැවැත්වේ. මේ අවස්ථාව දැක බලා ගැනීමට සැදැහැවත්හු ගංතොටට රැස් වෙති. කපු මහතා දියට බැස, රන් කඩුවෙන් දිය කපයි. ඒ සමග ම රන් කෙණ්ඩියට ජලය පුරවා ගනියි. සැදැහැවත්හු එතන දී ජලස්නානය කරති. මෙම ජලය ස්නානය කිරීමෙන් ලෙඩ රෝග සුව වන බවට මිනිසුන් අතර විශ්වාසයක් පවතී. දිය කැපූ පෙරහැර ආපසු මහනුවර බලා ගමන් කරයි. ඒ ඒ දේවාල භූමිවලට පිවිසීමෙන් උත්සවය අවසාන වේ. වාර්ෂික දළදා පෙරහැර එසේ නිමාවට පත් වේ.

## ක්‍රියාකාරකම : 1

i. පෙරහැරේ ඉදිරිපත්වන අංග අනුපිළිවෙළින් කියන්න.

ii. දළදා පෙරහැරට එකතු වන අනෙක් පෙරහැරවල් මොනවා ද?

iii. දළදා පෙරහැරේ දක්නට ලැබෙන නැටුම් වර්ග පහක් කියන්න. ලියන්න.

iv. දළදා පෙරහැරේ සිටින අය හා ගෙන යන දේවල් වගුගත කරන්න.

v. පහත සඳහන් කොටු තුළ ඇති වාක්‍ය කොටස් ගළපා වාක්‍ය සාදන්න.

| | |
|---|---|
| කසකරුවෝ | කාගේත් සිත් ගත් නැටුමකි. |
| රන්දෝලි පෙරහැර | කොඩි රැගෙන යති. |
| ළමයි | කස පුපුරවති. |
| කවිකාර මඩුල්ල | වීථි සංචාරය කරයි. |
| කාවඩි | කවි ගායනා කරති. |

## ක්‍රියාකාරකම : 2

ඔබ දැක ඇති වෙනත් පෙරහැරක විස්තර ඔබේ පන්තියට ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 3

ඔබ දුටු පෙරහැරක හා දළදා පෙරහැරේ දක්නට ලැබෙන සමාන අංග මොනවා ද?

## ක්‍රියාකාරකම : 4

පහත සඳහන් මාතෘකා යටතේ ලියැවුණු ලේඛන සොයා කියවන්න.

- දළදා මාලිගය
- වැඩිහිටියන්ට ගරු කිරීම